# වයස 5ට අඩු දරු පැටව් දාලා අම්මලා රට යෑමේ තහනම ඉවතට

# කාසි අරන් අම්මා එනකොට

## මල් කැකුළු පොඩිවෙලා තිබුණොත්...



රැකියා සඳහා විදේශගතවීමේ අයිතිය මේ රටේ ඕනෑම පුරවැසියකු සතු අයිතියක්. ඒ නිසාම විවිධ රැකියා සඳහා අපේ රටෙන් බොහෝ දෙනෙක් විදේශගත වෙනවා. ඒ අතර වැඩි පිරිසක් සිටින්නේ කාන්තාවන් බවත් රහසක් නොවෙයි. පවුල් ප්‍රශ්න දරාගැනීම අසීරු වුණාම, දරුවන්ට හරි හමන් කෑමක් බීමක් දෙන්න තරම් හැකියාවක් නැතිවුණාම, ජීවත්වෙන පැල් කොටේ තෙමෙන්න ගත්තාම, කවද හරි දවසක ගෙයක් දොරක් හදාගන්න, දරුවන්ට උගන්වන්න දහසක් බලාපොරොත්තු පොදි බැඳන් අපේ මවුවරු විදේශගත වෙනවා. එහෙත් දරුවෙකු ළඟ මව් සෙනෙහස, ආරක්ෂාව රැඳෙන්න ඕනෑම කාලයේ ඒ පහස දරුවෙකුට අහිමිවීම එතරම් සුබ නිමිත්තක් නොවෙයි. ඒ නිසාම අවුරුදු පහට අඩු දරුවන් සිටින මවුවරුන්ට රැකියා සඳහා විදේශගතවීම තහනම් වන නීතියක් මෙතෙක් අපේ රටේ ක්‍රියාත්මක වුවත් මේ වන විට එම නීතිය ඉවත් කර තිබෙන නිසා මේ පුංචි දරු පැටියන් තනිකර දමා විදේශගත වන මවුවරුන්ගේ ප්‍රවණතාවක් දකින්නට ලැබෙනවා. කෙසේ වුවත් එය දරුවාගේ අනාගත ජීවිතයට බලපාන්නේ කොහොමද? මවක් ලෙස ඔබ ඒ ගැන දැනුවත්ද?

### ආර්ථිකය හමුවේ කවුරුත් අසරණයි

"පුංචි දරුවෝ දාලා රට යන්න එපා කියලා කෙනෙක්ට ලේසියෙන්ම කියන්න පුළුවන්, ඒත් කවුද මේ දරුවන්ගේ බඩගින්න නිවන්නේ? උන්ට උගන්වන්න කීයක් හරි හොයල දෙන්නේ කවුද? උන්ගේ ඕනෑ එපාකම් බලන්නේ කවුද?" පොඩිවුන් දාලා රට යන දහසක් මවුවරුන්ට එහෙම අහන්න හිතෙනවා ඇති, නමුත් ආදරණීය අම්මේ මේ පුංචි දරුවන් අයිති නුඹට පමණක් නොවෙයි. මේ දරුවන් අයිති රටේ අනාගතයටයි.

කිරි කැටියා පුංචිම කාලේ ගෙදර කාගේ ළඟ හෝ දාලා රට ගිහින් අවුරුදු දෙකක් තුනක් ඉඳලා ආවාම අතේ සල්ලි ටිකක් තියනවනේ. ඒ වෙනකොට ළමයා ඉස්කෝලේ දාන කාලේ නිසා වියදම් කරන්න බයවෙන්න දෙයක් නැහැ. කොහොම හරි වියදම් කරලා හොඳ ඉස්කෝලෙකට දාගන්න පුළුවන්. ඒ නිසා දරුවා ලොකු වෙන්න කලින් පොඩි කාලෙම ගිහින් එන එක හොඳයි කියලා හිතන මවුවරුන් ඇති. නමුත් ඔබ සිතන ඒ සැපවත් ජීවිතය දරුවාට ලැබෙන විට ඔවුන්ගේ ජීවිතවලින් බොහෝ දේ ඈත්වීමට ඉඩ තිබෙන බව අමතක නොකල යුතුය.

> දරුවා සහ මව අතර සබඳතාව ඈත්වීම දරුවාගේ පෞරුෂ වර්ධනයට තදින්ම බලපෑම් ඇති කළ හැකිය. ඒ නිසා දරුවන් මුරණ්ඩුවීම, ආක්‍රමණශීලීවීම, ඔවුන්ගේ අනාගතය වෙනස් කිරීමට පවා බලපෑම් ඇති කරවිය හැකිය.

අදහස් දැක්වීම : ආචාර්ය
**අනූෂා එදිරිසිංහ**
අධ්‍යක්ෂක, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන කේන්ද්‍රය,
කැලණිය විශ්වවිද්‍යාලය

### දරුවන්ගේ ආරක්ෂාව බාරගන්නේ කවුද?

අවුරුදු පහ හෝ ඊට වඩා අඩු දරුවකු දමා විදේශගත වන මවක් නම් ඔබ එම දරුවා දමා යන්නේ කා ළඟද? පියා ළඟ හෝ සහෝදර සහෝදරියන් ළඟද? එහෙමත් නැතිනම් ඔබේ මවුපියන් ළඟද? එසේ නම් ඔවුන් ළඟ දරුවාට අවශ්‍ය රැකවරණය, ආදරය සෙනෙහස, තිබෙනවාද? විශේෂයෙන් මවකගෙන් කෙරෙන වැඩ කටයුතු ඔවුන්ට දරුවා වෙනුවෙන් ඉටු කිරීමට කාලය සහ හැකියාවක් තිබේද? පියා මතට ඇබ්බැහි වූ අයෙක් නම් දරුවාගේ ආරක්ෂාව ගැන අවධානයක් තියේවිද? ආදී බොහෝ කාරණා ගැන සිතා බැලිය යුතුය. එයට මූලිකම හේතුව වන්නේ කුඩා දරුවකුට, අපරාධයක්, අපයෝජනයක්, හෝ කාගෙන් හෝ යම් වරදක් සිදුවුවහොත් ඒ ගැන අදහස් දැක්වීමට තරම් තේරුමක් නොමැතිවීමයි. එම නිසා මොනතරම් ආරක්ෂාවක් තිබුණත් වයස අවුරුදු පහට අඩු දරුවකුගෙන් මව වෙන්වීම එම දරුවාට මානසික වශයෙන්ද බලපෑම් ඇති කරනු ලැබේ.

### අම්මා ළඟ නැතිවීම අනාගතයට බලපාන්නේ කොහොමද?

මව සහ දරුවකු අතර තිබෙන්නේ ගසට පොත්ත මෙන් එකතු වූ බැඳීමකි. විශේෂයෙන් දරුවකුගේ මොළය ධනාත්මක සිතුවිලිවලින් වර්ධනයවීමට, සිතන පතන දේවල් යහපත්වීමට, ශාරීරික වශයෙන් සෞඛ්‍ය සම්පන්නවීමට, මවගේ ආදරය, සෙනෙහස වැදගත් වේ. කෙනෙක් මේ ගැන එතරම් දුරට නොසිතුවත් මවගේ වෙන්වීමෙන් දරුවාට වන මානසික බලපෑමේ ප්‍රතිඵල අනාගතයේ දවසක භුක්ති විඳීමට සිදුවිය හැකිය.

එසේ වෙන්වීමෙන් මුලින්ම දරුවාට අහිමි වන්නේ ආරක්ෂාව සහ පෝෂණයයි. සමහර වෙලාවට දරුවන් තමන්ගේ මහලු මවුපියන් ළඟ දමා යන පිරිස්ද සිටිති.. ඔවුන්ට ඔවුන්ගේ කටයුතුවත් හරියට කරගත නොහැකි නිසා බොහෝ වෙලාවට පුංචි දරුවන්ට අවශ්‍ය පෝෂණය නිසි පරිදි නොලැබීමට ඉඩ තිබේ. වෙන කෙනකු ළඟ දමා ගියත් මවක් දරුවාට ලබාදෙන කාලය තරම්ම වැය කිරීමට තරම් කාලයක් නොමැතිවීමෙන් ඔවුන් පෝෂණ ඌනතාවලට ලක්වීමට පුළුවන. එයින් දරුවාගේ නිරෝගීතාවය, වර්ධනය, ප්‍රතිශක්තිය අඩාලවීමට ඉඩ තිබේ. මූලිකම දේ වන්නේ දරුවා සහ මව අතර සබඳතාව ඈත්වීම දරුවාගේ පෞරුෂ වර්ධනයට තදින්ම බලපෑම් ඇති කළ හැකිය. ඒ නිසා දරුවන් මුරණ්ඩුවීම, ආක්‍රමණශීලීවීම, ඔවුන්ගේ අනාගතය වෙනස් කිරීමට පවා බලපෑම් ඇති කරවිය හැකිය.

එපමණක් නොවේ, මව දරුවන් ළඟ නොමැතිවීමෙන් ඔවුන් විවිධ අපයෝජනවලට හිරිහැරවලට ගොදුරුවීමට තිබෙන ඉඩකඩ වැඩිය. එවැනි දේකට පත්වුණු දරුවන්ගේ මානසිකත්වය මුළු ජීවිත කාලය පුරාවටම බලපෑම් ඇති කළ හැකිය. එම නිසාම මුදල් සොයා දරුවන්ගේ අනාගතය සුබිත මුදිත කරන්නට කලින් ඔවුන්ගේ අනාගත ජීවිතය ගැන මීට වඩා වැඩි අවධානයකින් කටයුතු කිරීම මවකගේ යුතුකමකි.

■ සටහන : නයනා උදයංගනී